අපහසු තත්ත්වයේ එකක්. ඊට පස්සේ ඒක බලාගෙන වෙලාව අරගෙන කල්පනා කර කර දෙවනි පිටපත ලියනවා. අවසාන පිටපතේදි ලියවෙන්නේ දෙවනි පිටපතට සංශෝධන. පොතක් ලියනකොට මම ඒක කිසිම කෙනෙකුට පෙන්වන්නේවත් ඒ ගැන කිසිම කෙනෙක් එක්ක සාකච්ඡා කරන්නෙවත් නෑ. එහෙම කළොත් ඒ අයගේ අදහස් නිසා මගේ සැළැස්ම වෙනස්වෙයි කියන බයක් හිත ඇතුළේ තියනවද දන්නේ නෑ.

**මොනවගේ අත්දැකීම්ද තෝරගන්නේ ? ඒවා කොහොමද කතාවට යොදාගන්නේ ?**

තදින්ම හිතට දැනුන අත්දැකීම්වලින් තමයි නවකතාවක සිද්ධි නිර්මාණය කරන්නේ. අපේ පවුලේ වැඩිමල් දෙන්නම ගෑනු ළමයි. මේ දෙන්නම කුඩා කාලෙදිම මියගියා. ලොකු අක්කා චන්ද්‍රාවතී වයස අවුරුදු නවයෙදි මියගියා. ඒ කාලේ ඒ සිදුවීම මට තදින් දැනුනේ නැති වුණාත් පස්සේ කාලෙදි මතක් වෙනකොට සංවේගයක් දැනෙන්න ගත්තා. මම සාහිත්‍ය නිර්මාණයක් සඳහා යොදාගත්ත මුල්ම තීව්‍ර අත්දැකීම මේක. චරිත තුනක් නවකතාවේ පියාගේ මිනිය තැන්පත් කරන්න මිනී පෙට්ටිය හදන ආකාරය මම විස්තර කළේ බතලවත්තේ සේතන් බාස් අක්කගේ මිනී පෙට්ටිය හදපු ආකාරය ගැන මගේ හිතේ තිබුණ මතකයෙන්.

**ඔබ මුලින්ම ලියන්න පෙළඹිලා හිටියේ නවකතා සහ කවි කියලා කිව්වා. කෙටි කතා ලියන්න පටන්ගත්තේ මොන විදිහටද ?**

ඉස්කෝලෙ යන කාලේ ඉදළම කෙටි කතාත් ලියනවා. පත්තරවලට කාලයක් තිස්සේ කෙටි කතා ලිව්වත් එකක්වත් පළවුණේ නෑ. පස්සේ මම ලියපු කෙටිකතා එකතුවක් 'පුනරුප්පත්තිය' කියලා පොතක් විදිහට මුද්‍රණය කළා. මොන හේතුවක් නිසාද මම දන්නේ නෑ ඒක පුදුම විදිහට විකුණුනා.
මුල් කාලයේ මම පත්තර සගරා ගණනාවකටම ලිපි රචනා ලිව්වා. ඒත් එකක්වත් පළවුණේ නෑ. දුම්බීමේ ආදීනව විස්තර කරලා 'ධර්ම රශ්මි' කියන සගරාවට ලියපු කවි පන්තියක් තමයි පළවුණ මුල්ම රචනාව වුණේ. 'සුබස' 'නුවණ' 'සිංහල බෞද්ධයා' වගේ පත්තර සගරාවලට තමයි ලියපු තරමක් ලිව්වේ. 'දිනමිණ' 'සිළුමිණ' පත්තරවලට නම් මම කිසිම දෙයක් ලිව්වේ නෑ. ඒවයේ තියෙන්නේ හඩු බස් වහරක් කියන අදහස තමයි එදා අපිට තිබුණේ.

**වෙනත් පොත් ලියන්න යොමුවෙන්නේ ?**

නිර්මාණ සාහිත්‍ය ලියන එක අත්හැරියාට පස්සේ මම ශාස්ත්‍රීය පොත් ලියන්න යොමුවුණා. බුද්ධාගමේ අද තියන පිළිගැනීම් ගැන ලියපු විවේචනාත්මක පොතක් නිසා වතාවක් මට ලොකු විරෝධතාවකට මුහුණ දෙන්න සිදුවුණා. හාමුදුරුවරු පිරිසක් ගාලුපාර හරස්කරලා රැස්වීමකුත් පැවැත්තුවා මේකට විරුද්ධව. ඊට පස්සේ ඒක මුද්‍රණය නොකර කාලයක් හිටියා. වර්ථමානයේ බුද්ධාගමේ තියන පිළිගන්න අමාරු දේවල් ගැන මම ඉස්කෝලේ යන කාලේ ඉදළම විවේචනාත්මකව බලලා තියනවා. පොළොව යට අවීචි මහ නරකයක් තියනවා කියන එක ගැන මම පන්තියෙදි ප්‍රශ්ණ කළාම ගුරුවරයෙක් ටිකක් කල්පනා කරලා කිව්වා අර පොතේ මෙහෙම තියනවා. මේ පොතේ තියෙන්නේ මෙහෙමයි. තවත් පොතක මෙහෙමත් තියනවා. ඒක තමයි මට කියන්න තියෙන්නේ කියලා. ඒ කාලේ ඉදළම මට අගමික භක්තියක් කියලා දෙයක් තිබුණේ නෑ. නමුත් මම ත්‍රිපිටකය පවා කියවලා මේ ගැන උනන්දුවෙන් හැදෑරුවා. එතකොට පෙණුන දෙයක් තමයි මේ අද හුගදෙනෙක් කියන භූත ත්‍රිපිටකයේ නෑ කියන එක.

**බොහෝ ලේඛකයන් වයසට යනකොට තමන්ගේ ආගමේ දර්ශණය ජීවන දර්ශණය කරගන්නවා. ඔබේ ජීවන දර්ශණය මොකක්ද ?**

මගේ ජීවන දර්ශණය තරමක් භෞතික එකක්. එය පමණක් මිනිසාට මදි කියලා මට හිතෙනවා. එතනදි මම බ්‍රර්ට්‍රම් රසල් වැනි අයගේ අදහස්වලට ගරු කරනවා. මගේ ජීවන දර්ශණය මාක්ස්වාදය වුණ කාලයකුත් තිබුණා. ඒක භෞතික වැඩියි කියලා තෙරුණාට පස්සේ මම ඒකෙන් අයින් වුණා. මාක්ස්වාදය ගරු කළ කාලේ මම මාසයක් විතර කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක් වෙලත් හිටියා. ඒ කාලේ පක්ෂයේ අර්බුධ තිබුණ කාලේ. මරදානේ කාර්යාලේ තිබුණේ. ඉහළින් එන සියළුම දේ හරි කියලා අනුමත කරන එක තමයි එතන කෙරුණේ. ටික දවසකින්ම මේ වැඩේ මට එපා වුණා. එතනින් පස්සේ දේශපාලනයට සම්බන්ධ වුණෝ නෑ.

**පොත් ලියලා ජීවත්වෙන්න බෑ කියලා කතාවක් අපේ සමාජයේ තියනවා. ඔබ ඒ කතාවත් එක්ක එකගවෙනවද ?**

වතාවක් ජේ ආර් ජයවර්ධන ප්‍රසිද්ධියේ කියලා තිබුණා පොත් ලියලා ජීවත්වෙන්න තියා අඩු තරමින් ටැලිපෝන් බිලක් ගෙවා ගන්නවත් පුළුවන්ද කියලා. දවසක් කිරිදිවැළ පාසළේ පන්ති කාමරයකදි මම කතාවක් කරන කොට කිව්වා එයා එහෙම කියලා තිබුණාට මම නම් පොත් ලියලා ටැලිපෝන් දෙකක්ම අරගෙන තියනවා. ගෙවල් දෙකක් හදලා තියනවා. කාර් දෙකක් අරගෙන තියනවා කියලා. ඒ පාසලේ හිටපු ගුරුවරයෙක් මේක දිවයින පත්තරේට ලියලා ඊට පස්සේ කීප



වතාවක්ම මගේ කතාව පත්තරවල පළවෙලා තිබුණා. මම කිව්වේ බොරුවක් නෙවෙයි. මම හැමදෙයක්ම කරගත්තේ පොත් ලිවීමෙන්. මම දන්නේ නෑ ඒකට හේතුවුණෙ ලිවීමද පොත් ප්‍රකාශනද ඒ දෙකම ද කියන්න. කොහොම වුණත් මට හිතෙන්නේ මේක කැපවීමකින් කරනවා නම් හොද ජීවන මට්ටමක් ඇතිකරගන්න පුළුවන්කම තියනවා කියන එකයි.

**ඔබේ දරුවන් කවුරුත් සාහිත්‍යයට යොමුවෙලා නෑ. ඇයි ඒ ?**

මට දුවලා දෙන්නයි පුතාල දෙන්නයි ඉන්නේ. ඒ හැම කෙනෙකුටම මම හොදට ඉගැන්නුවා. හැම කෙනෙක්ම අඩුතරමින් එම්.එස්සී. එකක්වත් කරලා තියනවා. දෙන්නෙක් දැන් පිටරට ඉන්නේ. අනෙක් දෙන්නගෙන් එක දුවෙක් එක්ක තමයි මම මෙහෙ ඉන්නේ. දරුවෝ සාහිත්‍ය පැත්තට ඒ තරම් යොමුවුණේ නෑ. මම යොමු කළෙත් නෑ. ඒ අයට කැමති පාරක යන්න මම පහසුකම් සළසල දුන්නා.

**අනාගත බලාපොරොත්තු මොනවද කියලා මම ඇහුවොත් ?**

එහෙම කිසිම දෙයක් නෑ. කරන්න පුළුවන් හරිය පුළුවන් කාලේ කළා. දැන් ඉතිං අසූවත් පැන්නට පස්සේ තව මොනවද අනාගත බලාපොරොත්තු.

ශ්‍රීලාල් සෙනෙවිරත්න
Srilal333@gmail.com


**පිවිසෙන්න www.sannasa.net**

YSL

# Migration Services

ශ්‍රී ලාංකික ඔබට
සොඳුරු සේවය

**We specialise in**

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Lead Design House

**Yashodhara Sarachchandra Liyanaarachchi**
(Registered Migration Agent)
MARN: 0746956

**0430 359 006**

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805

Now also available for consultation at
**Bundoora**
(Close to Latrobe university , RMIT and NMIT)

**6 Mat Rush Avenue, Bundoora, VIC 3083**

Tel: **03 9467 4468**

yasho@yslmigration.com

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA